# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,472/19 – 2006 නොවැම්බර් 23 වැනි බ්‍රහස්පතින්දා – 2006.11.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 11/80 III.

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා, සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍ය.

2006 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2006 ආහාර (වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2007 මැයි මස 01 දින දින සිට බලාත්මක විය යුතුය.

2. යම් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් කිසිදු තැනැත්තකු විසින් මෙහි I වන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව සඳහන් කර ඇති (මෙහි මින්මතු “අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය” යනුවෙන් සඳහන් කරනු ලබන) යම් අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් වන්නේ නම් මිස, ආහාර සකස් කිරීමේ දී සම්මිශ්‍රණයක් ලෙස කිසිදු වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් ප්‍රචාරය කිරීම හෝ භාවිතයට ගැනීම නොකළ යුතුය.

3. කිසිදු තැනැත්තකු විසින් මෙහි උපලේඛනයේ I වන හා II වන වගුවල නිශ්චිතව සඳහන් කර ඇති අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් හැර වෙනත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් අඩංගු කර හෝ ගල්වා ඇති ආහාර නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතුය.

4. කිසිදු තැනැත්තෙකු විසින් මෙහි I වන උපලේඛනයේ III වන වගුවේ නිශ්චිතව සඳහන් කර ඇති තනුකකාරකයක් හැර අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් තනුකකරණය කිරීම සඳහා වෙනත් යම් තනුකකාරකයක් ප්‍රචාරය කිරීම හෝ භාවිතා කිරීම නොකළ යුතුය.

5. කිසිදු තැනැත්තකු විසින් 6 වන නියෝගයේ විධිවිධාන සලසා ඇති පරිදි හැර යම් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් අඩංගු කර ඇති හෝ ගල්වා ඇති පහත දැක්වෙන ආහාර නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතුය.

(i) අමු හෝ සකස් නොකළ මස් ;

(ii) දඩ මස් ;

(iii) කුකුල් මස් ;

(iv) මාළු ;

(v) පළතුරු ;

(vi) එළවළු ;

(vii) කෝපි ඇට ;

(viii) කෝපි කුඩු ;

(ix) කෝපි රසකාරක ;

(x) තේ ;

(xi) විශේෂ වර්ගවල පාන් හැර වෙනත් පාන් ;

(xii) ක්‍රීම් ;

(xiii) මේද ඉවත් කළ හෝ නොකළ දියරමය කිරි ;

(xiv) උකු කිරි ;

(xv) පිටි කළ (වියලන ලද) කිරි.

6. 5 වන නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති ආහාර නිෂ්පාදනවල එහි II වන තීරයේ අනුරූපී සටහන තුළ නිශ්චිතව සඳහන් කර ඇති අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් අඩංගු විය හැකිය.

7. (අ) මේ නියෝගවලින් කෘතිම වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් ආහාරවලට එක් කිරීමට අවසර දී ඇති විට ආහාරයේ අඩංගු කෘතිම වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයේ අනුපාතය, තනිව හෝ සාමූහිකව ගත් කළ, පරිභෝජනය සඳහා සූදානම් කරන ලද ආහාරයේ හෝ පානයේ කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් සියයක් නොඉක්මවිය යුතුය.

(ආ) ද්‍රවමය වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය කිලෝග්‍රෑම් එකක සම්මිශ්‍රණයක අවසර ලත් පරිරක්ෂක ද්‍රව්‍යයක් ලෙස බෙන්සොයික් ඇසිඩ් මිලිග්‍රෑම් හාරසියයකට නොවැඩි ප්‍රමාණයක් අඩංගු විය හැකිය.

8. III වන උපලේඛනයේ (1) වන සහ (2) වන ඡේදවල නියමයන්ට අනුකූල වූ ලේබලයක් සහිත භාජනයක අසුරා ඇත්නම් මිස ආහාර සකස් කිරීමේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා (යම් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය සම්මිශ්‍රණයක සංඝටකයක් වන වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් හෝ යම් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය හා රසකාරක සම්මිශ්‍රණයක සංඝටකයක් වන වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් ද ඇතුළුව) යම් අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් කිසිම තැනැත්තකු විසින් භාවිතා කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතුය.

9. මේ නියෝගවල නිශ්චිතව සඳහන් කර ඇති පරිදි අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් එකතු කර ඇති ආහාරයක් අඩංගු සෑම බහලුමකම හෝ අසුරණයකම, 2005 ජනවාරි මස 19 වන දින අංක 1376/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ) නියෝග 2005 හි දක්වා ඇති ආකාරයේ ප්‍රකාශනයක් තිබිය යුතුය.

10. මේ නියෝගවල කාර්ය සඳහා -

"වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය" යන්නෙන්, මේ නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් අදහස් වේ ;

"වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය සම්මිශ්‍රණය" යන්නෙන්, අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය එකක් හෝ වැඩි ගණනක් මිශ්‍ර කිරීමෙන් සකස් කල නිෂ්පාදනයක් අදහස් වේ ;

"තනුකකාරකය" යන්නෙන්, ආහාර වර්ණ ගැන්වීමේදී මිශ්‍රණයේ භාවිතය පහසු කරවීම පිණිස වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යය හෝ ද්‍රව්‍යයන්ට මිශ්‍ර කරන දියරයක් අදහස් වේ.

## I වන උපලේඛනය

### I වන වගුව

ආහාර වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය ලෙස යොදා ගත හැකි අනුමත කෘතිම වර්ණක

| වර්ණකය | පොදු නාමය | වර්ණක දර්ශකය | ජාත්‍යන්තර අංකන ක්‍රමය අනුව අංකය |
|---|---|---|---|
| රතු | කාමොසීන් | 14720 | 122 |
| | පොන්සියු 4 ආර් | 16255 | 124 |
| | එරිත්‍රොසීන් | 45430 | 127 |
| කහ | සන් සෙට් යෙලෝ | | |
| | එෆ්.සී.එෆ් | 15985 | 110 |
| | ටාට්රසින් | 19140 | 102 |
| නිල් | ඉන්ඩිගෝ කාමයින් (ඉන්ඩිගෝටයින්) | 73015 | 132 |
| | බ්‍රිලියන්ට් බ්ලු එෆ්.සී.එෆ් | 42090 | 133 |
| කොළ | ග්‍රීන් එස් | 44090 | 142 |

වගු අංක 1 හි සඳහන් කෘතිම වර්ණක පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ලිය යුතුය.

| | |
|---|---|
| පිරිසිදු වර්ණක | අවම වශයෙන් 85.0% |
| ජලයේ අද්‍රාව්‍ය ද්‍රව්‍ය | උපරිම වශයෙන් 0.1% |
| අතිරේක වර්ණක | උපරිම වශයෙන් 4.0% |
| ඊතර් මගින් නිස්සාරණය කර ගත හැකි ද්‍රව්‍ය | උපරිම වශයෙන් 0.2% |
| අතරමැදි ද්‍රව්‍ය | උපරිම වශයෙන් 0.5% |

### II වන වගුව

ආහාරවල භාවිතය සඳහා අනුමත කර ඇති වෙනත් වර්ණක

| ජාත්‍යන්තර අංකන ක්‍රමය අනුව අංකය | ස්වභාවික වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය | වර්ණක දර්ශකය |
|---|---|---|
| 100 | කර්කියුමින් | 75300 |
| 120 | කොචිනිල් (කාමිනික් අම්ලය) | 75470 |
| 140 | ක්ලෝරොෆිල් | 75810 |
| 150 b | කැරමල් | |
| 160 a | කැරොටින් (ඇල්පා බීටා හෝ ගැමා) | 75130 |
| 160 b | ඇනාටෝ | 75120 |
| 160 c | කැප්සැන්තින් හෝ කැප්සොරුබින් | |
| 160 d | ලයිකොපින් | 75125 |
| 160 e | බීටා - ඇපො 8' - කාටිනල් | |
| 160 f | බීටා - ඇපො 8' - කැරටිනොයික් අම්ලයේ මෙතිල් හෝ එතිල් එස්ටර් | |
| 161 a | ෆ්ලේවොක්සැන්තින් | 75135 |
| 162 | බීට්රූට් රතු (බෙටනින්) | |
| 163 | ඇන්තොසයනින් | |
| 171 | ටයිටේනියම් ඩයොක්සයිඩ් | 77891 |

III *වන වගුව*

*අනුමත තනුක කාරක*

පහත දැක්වෙන තනුක කාරක වර්ණක මිශ්‍රණවලදී යොදා ගැනීම සඳහා අනුමත කර ඇත.

1. කුඩු වශයෙන් ඇති වර්ණක මිශ්‍රණ සඳහා

- ඇන්හයිඩ්‍රස් සෝඩියම් සල්ෆේට්
- සෝඩියම් ක්ලෝරයිඩ්
- සුක්රෝස්
- ඩෙක්ස්ට්‍රෝස්
- කෝන් ෆ්ලාර්
- ස්ටාච් (පිෂ්ඨය)

2. ද්‍රව වශයෙන් පවතින වර්ණ මිශ්‍රණ සඳහා

- ජලය
- එතිල් ඇල්කොහොල්
- පරිභෝජනයට සුදුසු තෙල්
- සීනි සිරප්
- සෝබිටෝල්
- ග්ලිසරින්
- ප්‍රොපිලීන් ග්ලයිකෝල්

II *වන උපලේඛනය*

| *I වන තීරය*<br>*ආහාර නිෂ්පාදනය* | *II වන තීරය*<br>*වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යය* |
|---|---|
| 1. රස කළ කිරි | ඕනෑම අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් |
| 2. යෝගට් | ඕනෑම අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් |
| 3. "වර්ණ ගැන්වූ" යන වචන දොඩම් ගෙඩියේ මතු පිට සඳහන් කර ඇති දොඩම් | ඕනෑම අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් |
| 4. බටර් | කැරොටීන්<br>ඇනාටෝ<br>ටර්මෙරික් |
| 5. ඝන චීස්<br>මෘදු චීස්<br>මෝරු සහිත චීස් හෝ වෙනත් යම් ආකාරයක චීස් | කැරොටීන්<br>ඇනාටෝ |
| 6. ඝන චීස් වල පිටත ආවරණය | ඕනෑම අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් |

III වන උපලේඛනය

1. 8 වන නියෝගයට අදාළ වන එක් එක් බහලුවක් හෝ අසුරණයක් මත පහත දැක්වෙන ප්‍රකාශනයක් දැක්වෙන ලේබලයක් තිබිය යුතුය : -

(අ) එක් එක් අවසරලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයේ සාමාන්‍ය හෝ පොදු නාමය හෝ ඒ අවසර ලත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයේ නියමිත නාමය සහ ඒ වර්ණයට අදාළ අනුක්‍රමික අංකය (අයි. එන්. එස්. අංකය) ;

(ආ) වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයන් එකකට වැඩියෙන් පවතින අවස්ථාවකදී ඒ එක් එක් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයේ සාමාන්‍ය හෝ පොදු නාමය හෝ නියමිත නාමය සහ ඒ වර්ණයට අදාළ අනුක්‍රමික අංකය (අයි. එන්. එස්. අංකය) ;

(ඇ) අනුමත වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයක් තනුකකාරකයක් සමඟ සම්මිශ්‍රණය කර ඇති විට තනුක කරන ලද මිශ්‍රණයේ අඩංගුව පවතින තනුක කාරකයේ සහ වර්ණ ගැන්වීමේ ද්‍රව්‍යයේ අනුපාතය.

2. 1 වන ඡේදයට අනුව මුද්‍රණය කරනු ලැබීමට අවශ්‍ය ඕනෑම ප්‍රකාශනයක් : -

(අ) පැහැදිලි හා පහසුවෙන් කියවීමට හැකි විය යුතුය ;

(ආ) මිල දී ගැනීමේ සාමාන්‍ය කොන්දේසි යටතේ භාණ්ඩය මිලදී ගැනීමට අදහස් කරන ගැනුම්කරුවකුට පහසුවෙන් කියවිය හැකි සහ තේරුම් ගනු ලැබිය හැකි පරිදි ලේබලය මත ප්‍රකටව පෙනෙන ආකාරයකින් ඒ ප්‍රකාශනය යම් ආකාරයකින් බහාලුව හෝ අසුරණය මත ආරක්ෂාකාරී ලෙසින් අලවා තැබිය යුතුය ;

(ඇ) වෙනත් ඕනෑම ආකාරයකින් සැඟවී හෝ නොපැහැදිලිව දර්ශනය වන ආකාරයෙන් නොතිබිය යුතු ය.

12-336

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.